බුද්ධි ප්‍රබෝධ ගේ මරණය සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ දැඩි කතාබහක් ඇති වී තිබිණි. කෙසේ නමුත්, ඒ සම්බන්ධයෙන් වාර්තා කර තිබූ මාධ්‍ය කෙතරම් දුරට මාධ්‍ය ආචාර ධර්මයන් රැක තිබුණා දැයි යන්න සැකයකි.
නිදසුනක් ලෙසට, අප්‍රේල් 20, 2023 දින දිනමිණ කතුවැකිය සලකා බැලීමට හැක. මෙම කතුවැකිය තුළ, දිවි තොර කරගැනීමක් බවට සඳහන් වන මෙම බුද්ධි ප්‍රබෝධගේ මරණය සම්බන්ධයෙන්, එය ගෝල්ෆේස් අරගලය හා සම්බන්ධ කරමින් සඳහන් කොට ඇත.
ඔබ දකිනා ආකාරයට,
1) මෙම මරණය, "සියළු පාලකයන් වෙත මරණය ප්‍රාර්ථනා කළ බුද්ධි ප්‍රබෝධ නම් අයෙකුගේ" යනුවෙන් සඳහන් කිරීම පදනම් සහගත යැයි ඔබ සිතන්නේ ද?
2) මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකමින් දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කළ යුතු බවට මාධ්‍ය මාර්ගෝපදේශයන් මඟින් උපදෙස් දී තිබියදීත්, "ලාවට ලූස් ඇති එවැනි ඇයෝ" වැනි සඳහන් කිරීම් කෙතරම් දුරට සංවේදී වන්නේ ද?
3) මෙවැනි කතුවැකියක් ඔස්සේ, මිය ගිය අයට අවමානයක් සහ අගෞරවයක් සිදු නොවන්නේ ද? මිය ගිය අයගේ සමීපතමයන් හටද මෙවැනි සඳහන් කිරීම් සිත් වේදනා ගෙන නොදෙන්නේ ද?
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!




අලුගෝසුවනේ පිච් හදපන්

මේ ආකාරයට වපුරන ලද වෛරය දැන් ඒ පැත්තටම පත්තු වෙමින් තිබේ. ඒ සඳහා හොඳ වැඩේ කියනා 'කුරිරු සතු-ටක්' අපට නැත්තේ මුත්, ගෝල්ෆේස් අරගලය නම්, රටක් අල කළ සංසිද්ධිය සඳහා පිච් එක සැකසූ, සියලු පාලකයන් වෙත මරණය ප්‍රර්ථනා කළ, බුද්ධි ප්‍රබෝධ නම් අයකු සිය-දිවි නසාගෙන ඇතැයි සමාජ මාධ්‍ය වාර්තා කළේය. කාල-යක් තිස්සේම මානසික රෝග සඳහා ප්‍රතිකාර ගත් මේ තරු-ණයාගේ අවාසනාවන්ත සමුගැනීම 'අරගලය' යළි කියැවීම සඳහා හොඳ අවස්ථාවකි.

තමන් හැර අන් සියලු දෙනා පිළිබඳව මිථ්‍යාව පතුරුවන විට මේ ගණයේ මල්ලිලා ඒ පිච් එකේ යකා නටන්නේ, ලොකු අයියලා කියන බයිලා, ඇත්ත කියා සිතට ගෙනය. 'ලාවට ලූස්' ඇති එවැනි ඇයෝ පනහක් හැටක් එකතු වූ විට, පිච් එකේ මැච් එක ගැසීමට අයියලා පිටියට බසින්නේය. පළමුව එක දිගට පාරට බැසීමය. දෙවැනුව වටකිරීමය. තෙවැනුව ගෙදර ඇති ගෑස් සිලින්ඩරය සාලය මැද්දට ගෙන, රටේ සිටින ප්‍රතිවාදීන්ගේ ගෙවල් ගිනි තබා ජීවිත හානි කිරීමය.